

විදුදය

භාෂා, සාහිත්‍ය, සංස්කෘතික හා මාධ්‍ය අධ්‍යයන ශාස්ත්‍රීය සංග්‍රහය

සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

VIDUDAYA

Journal of Language, Literary, Cultural and Media Studies

Department of Sinhala and Mass Communication, University of Sri Jayewardenepura

2024, 03 (01): 25-33

ISSN: 3051-5424

Journal homepage: https://journals.sjp.ac.lk/index.php/vidudaya

# සාහිත්‍යයේ නිරූපිත ශ්‍රී ලාංකේය බුද්ධ ප්‍රතිමා කලාවේ ප්‍රභවය හා පූර්ව අවදියේ බුද්ධ සංකේත වන්දනය

එම්. බී. දිල්හානි

කථිකාචාර්ය (ආධුනික)

සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
bhagyadilhani@sjp.ac.lk

## Abstract

Following the Mahindagamana, an intense reverence for Buddhism and the Buddha developed across the nation. Sri Lankan artists, in response, dedicated significant attention was directed to sculp the Buddha's form in statues, drawing inspiration from his spiritual essence. As time progressed, the art of crafting Buddha statues evolved, encouraging Buddhists who traditionally revered Buddhist symbols to begin worshiping through these statues. This study examines the origins of the Buddha image as depicted in literary texts and the shift from symbolic to statue worship using a qualitative research method. Based on evidence from primary sources like the Mahavamsa, Samanthapasadika, and Pujavaliya, and supplemented by othersecondary sources, it is evident that sculptors conceptualized and crafted Buddha's image in statues, capturing the character of Buddha as praised in the literature.

**Keywords:** Art of Buddha Statues, Lord Buddha, Buddha Symbols, Literary Works

## 1. හැඳින්වීම

ක්‍රි.පූ. තුන් වන සියවසේදී බුදු දහම ස්ථාපනය කිරීමේ අරමුණෙන් මිහිඳු මහ රහතන් වහන්සේ ලක්දිවට වැඩම කිරීමත් සමග මෙරට ආගමික, සමාජීය, දේශපාලන හා සංස්කෘතික වශයෙන් වෙනස්කම් රාශියක් ඇතිවූ බවට සාක්ෂ්‍යය අපමණය. ඉන්දියාවේ පැවති තෙවන ධර්ම සංගායනාවෙහි ප්‍රතිඵලයක් ලෙස ධර්මාශෝක රජු රටවල් ගණනාවක් පුරා බුදුදහම ව්‍යාප්ත කළ අතර ඒ අතුරින් ලංකාවද එක් රටක් විය. ප්‍රාග් බෞද්ධ සමයේදී වෘක්ෂ වන්දනාව, පර්වත වන්දනාව, දෙවියන් හා යක්ෂයන් පිදීම, ජෛන හා බ්‍රාහ්මණ ආගම් මෙන්ම සුළු වශයෙන් බෞද්ධාගමද මෙරට ජනතාවගේ වන්දනාවට පාත්‍රවූ බවට ඓතිහාසික තොරතුරු හමුවේ. එවැනි පරිසරයක් යටතේ බුදු දහම මෙරට චිරාත් කාලයක් පවතින පරිද්දෙන් ස්ථාපනය කිරීමෙහිලා මිහිඳු මාහිමියෝ උපක්‍රමශීලිව කටයුතු කළහ. සන්නිවේදනය සඳහා මෙරට පැවති භාෂාව ඉගෙනගැනීම, නව රාජ්‍ය සමයක් ආරම්භවන තුරු රැඳී සිට නියමිත කාලයේදී මෙරටට වැඩමකිරීම, උපසම්පදා විනය කර්මය හා මහණකම ලබාදීමේ පිළිවෙත් පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබාදීම සඳහා උන්වහන්සේ සමග පැමිණි භණ්ඩුක උපාසක මෙරටදී මහණ කිරීම හා නියම වශයෙන් මෙරට බුදුදහම ස්ථාපනයවූ බව දැනවීම සඳහා ලාංකිකයකු මහණකිරීම යනාදිය එසේ යෙදූ උපක්‍රමවලින් කිහිපයක් ලෙස පෙන්වාදිය හැකිය.

එසේම උන්වහන්සේ වැඩමකිරීමට පෙර මෙරට පැවති නිශ්චිත නොවූ ප්‍රාග් වන්දනා ක්‍රම, සංකේතාත්මක වූද, අරුත් සහිත වූද බෞද්ධ වන්දනා කෙරෙහි ආරෝපණ කිරීමද මෙහි ලා විශේෂ කොට දැක්විය හැකිය. නිදසුන් ලෙස වෘක්ෂ වන්දනාව ශ්‍රී මහා බෝධි වන්දනයටත්, පර්වත වන්දනාව ස්තූප වන්දනයටත්, මළවුන් පිදීම උතුම් නිවන අවබෝධ කර ගත් බුද්ධ වන්දනයටත් ආරෝපණ කිරීම පෙන්වාදිය හැකිය.

එසේම මහාවිහාර සීමා ලකුණු කිරීමත් සමග මෙරට පුරා බෞද්ධාගම ශීඝ්‍රයෙන් ව්‍යාප්ත විය. රාජ්‍යත්වය සඳහා බෞද්ධයකුවීම අත්‍යවශ්‍ය කාරණයක්වූ අතර සමාජයේ සියලු අංග කෙරෙහි බෞද්ධාගමේ බලපෑම සිදුවූයේ නිරායාසයෙනි. ආගමත්, ජාතියත් එක හා බැඳි සාධක දෙකක්වූ හෙයින් රාජ්‍ය පාලන කටයුතු සඳහා බෞද්ධාගමෙහි උපදෙස් අනුව කටයුතුකිරීම අනිවාර්යය සාධකයක් විය. පසුව ශ්‍රී මහා බෝධීන් වහන්සේ රැගෙන වැඩම කළ සංඝමිත්තා තෙරණිය සමග සොළොස් කලා පරිපූර්ණ ශිල්පීන්ගේ පැමිණීමෙන් මෙරට සංස්කෘතිකාංග කෙරෙහි ක්‍රමයෙන් බෞද්ධ මුහුණුවර ආරෝපණය වන්නට විය. බුදු දහමේ ව්‍යාප්තියත් සමග ශාරීරික, පාරිභෝගික, උද්දේසික යන ත්‍රිවිධ වන්දනා මෙරට ජනයා අතර ප්‍රචලිත වූ අතර එම වන්දනා පාදක කොටගත් කලා කෘති රාශියක්ද බිහිවීම එතැන් සිට ආරම්භ විය. මුල් කාලීනව බුදුන් වහන්සේ, ශ්‍රී පතුල් පාෂාණ හා ධාතු මගින් සංකේතාත්මකව වන්දනා මාන කොට ඇති අතර පසුව බුදු පිළිමය නිර්මාණය වීමෙන් බුද්ධ රූපකාය පිළිබඳ කලාකරුවන් කෙරෙහි දළ චිත්‍රයක් නිර්මාණය වීම බොහෝ දෘශ්‍ය කලා බිහි වීමට හේතු සාධක විය. එහිදී සාහිත්‍යකරුවා ස්වකීය නිර්මාණ කෘතිවල නිරූපණය කර ඇති බුදුන් වහන්සේගේ රූපකාය පසුව බුදු පිළිමය සකස් වීම කෙරෙහි බලපාන්නට ඇති බව පෙනේ. ඒ අනුව මෙහිදී සාහිත්‍යයේ නිරූපණය වී ඇති බුදු පිළිමයේ ප්‍රභවය සහ බුද්ධ සංකේත වන්දනය පිළිබඳ අධ්‍යයනයක යෙදේ.

මෙහිදී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කෙරිණි. ද්විතීයික මූලාශ්‍රය වශයෙන් මහාවංශය, පූජාවලිය, සමන්තපාසාදිකාව යන කෘති සහ මේ පිළිබඳ ලියැවී ඇති වෙනත් සාහිත්‍ය කෘති හා ශාස්ත්‍රීය ලිපි පරිශීලනය කරන ලදි.

## 2. සාකච්ඡාව

බුද්ධ ප්‍රතිමා කලාවේ ප්‍රභවය හා විකාසනය සම්බන්ධයෙන් පුරාවිද්‍ය පර්යේෂකයන් විවිධාකාර මත පළකර ඇති අතර එහි ලා මූලික වශයෙන් ප්‍රධාන මතවාද දෙකක් පිළිබඳ මෙහිදී අවධානය යොමුකර තිබේ. ඒ අනුව මහාචාර්ය සෙනරත් පරණවිතාන, ආචාර්ය ඒ. ඩබ්ලිව්. අදිකාරම්, චන්ද්‍රා වික්‍රමගමගේ හා ආනන්ද කුමාරස්වාමි වැනි උගතුන් පවසනුයේ ශ්‍රී ලංකාවේ බුදු පිළිම කලාව ඉන්දියානු බුදු පිළිම කලාවේ ආරම්භය හා සමකාලීනව එනම් ක්‍රි.ව. 01 වැනි සියවසේදී ආරම්භ වූ බවයි. ඒ සඳහා නිදසුන් ලෙස ඔවුහු මහඉලුප්පල්ලම බුද්ධ ප්‍රතිමාව, රුවන්වැලි සෑ ප්‍රතිමාව වැනි පුරාවිද්‍යාත්මක සාධක ඉදිරිපත් කරති. මෙම නිර්මාණ මගින් ඉන්දියාවේ ගන්ධාර හා මථුරා කලා සම්ප්‍රදායවල සම්මිශ්‍රණයක් වන අමරාවතී කලා ලක්ෂණ දක්නට ලැබෙන අතර අමුද්‍රව්‍ය ලෙස භාවිතකර ඇත්තේද කිරිගරුඬ හා හුණුගල්ය. මෙම අමුද්‍රව්‍යම භාවිත කොට, අමරාවතී කලා සම්ප්‍රදායය ගුරු කොට ගනිමින් නිර්මාණය කරන ලද තවත් ප්‍රතිමා රැසක් අනුරාධපුර කෞතුකාගාරයේ තැම්පත්කර තිබේ. මෙම කරුණු සැලකිල්ලට ගනිමින් මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා විසින් ඉදිරිපත් කරන ලද මතය වන්නේ මෙරට බුද්ධ ප්‍රතිමා කලාව අමරාවතී කලා සම්ප්‍රදායයේ ආභාසය සහිතව නිර්මාණය වන්නට ඇති බවයි. බෙන්ජමින් රෝලන්ඩ් නමැති කලා විචාරකයාද පරණවිතාන මහතාගේ මෙම අදහස හා එකඟවී තිබීම විශේෂ වෙයි.

මහඉලුප්පල්ලමෙන් හමුවී ඇති අඩි 6ක් පමණ උසින් යුක්ත යථෝක්ත ප්‍රතිමාව ලංකාවේ පැරණිතම බුද්ධ ප්‍රතිමාව ලෙස හැඳින්වෙන අතර එය ක්‍රි. ව. 1 - 2 සියවස්වලට අයත් යැයි මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා ඇතුළු එතුමාගේ මතය පිළිගත්තවුන්ගේ අදහස විය. මේ හැරුණු කොට ඩී. ටී. දේවේන්ද්‍ර, වල්පොළ රාහුල හිමි, මහාචාර්ය එන්. විජේසේකර හා කඹුරුපිටියේ වනරතන හිමි, මහාචාර්ය විමල විජයසූරිය වැනි උගතුන් දරනුයේ මීට වෙනස් ආකාරයේ මතයකි. ශ්‍රී ලාංකේය බුද්ධ ප්‍රතිමා කලාව ලංකාවෙහිම ප්‍රභවය වී ස්වාධීනව විකාසනය වූ කලාවක් වන බව ඔවුහු පවසා සිටිති. මේ සඳහා ඔවුන් මහාවංශය, සමන්තපාසාදිකාව, සිහල අට්ඨ කතා හා වංසත්ථප්පකාසිනී වැනි සාහිත්‍ය මූලාශ්‍රය සාධක ලෙස ඉදිරිපත් කොට ඇත.

ශ්‍රී ලංකාවේ රචිත කෘති අතර ප්‍රථම වරට බුද්ධ ප්‍රතිමා පිළිබඳ තොරතුරු සඳහන් වන්නේ සමන්තපාසාදිකාවේ හා මහාවංශයෙහිය. සමන්තපාසාදිකාවේ විනයට්ඨකථාහි තතීය සංගීතියේ දඹදිව අශෝක රජුගේ ආරාධනයෙන් කල්පායුෂ්ක වූ කාල නම් නා රජු විසින් දෙතිස් මහා පුරුෂ ලක්ෂණ, අසීත්‍යානුව්‍යඤ්ජන, ව්‍යාමප්‍රභා සහ කේතුමාලා යන ලක්ෂණවලින් යුක්ත බුද්ධ රූපයක් මවා දුන් බවත්, රජු විසින් එයට සත් දවසක් අක්ෂිපූජා පැවැත්වූ බව සඳහන් වෙයි. '...අශීත්‍යනුබ්‍යඤ්ජනයෙන් යුක්ත ද්වාත්‍රිංශද්වර මහාපුරුෂ ලක්ෂණයන්ගේ සශ්‍රීකතායෙන් විකශිතවූ රත්පියුම් නිලුපුල්, හෙළපියුම්වලින් ගැවසීගත් ජලතලාවක් වැනිවූ තාරකා සමූහයාගේ රශ්මිසමූහයෙන් පැතිරිගත් ශොභාවෙන් බබලන අහස්තලය වැනිවූ නීල පීත ලොහිතාදි ප්‍රභේදවත් විචිත්‍රවූ වර්ණ රශ්මියෙන් වළඳනාලද ව්‍යාමප්‍රභාවෙන් වටකළ විලාසය ඇතිබැවින් සන්ධ්‍යාප්‍රභාරාගයෙන් යුත් ඉඳුසැවුවෙන් හා විදුලියෙන් වටකළ රන්කඳු මුදුනක් වැනිවූ නන් පැහැයෙන් නිර්මලවූ කේතුමාලාවෙන් මොනවට බබලන මනොඥවූ මස්තක ශොභා ඇති දෙව්, බඹ, මිනිස්, නා, යක් සමූහයාගේ නෙත්‍රයන්ට රසායනයක් වැනිවූ බුදුරුව බලමින් සත් දවසක් මුළුල්ලෙහි අක්ෂිපූජාව කළේය...' (ධම්මකුසල හිමි, 2003: 38 පිටුව).

මින් අනතුරුව බුද්ධ ප්‍රතිමාවක් පිළිබඳ සඳහනක් මහාවංශයේ 30 වැනි පරිච්ඡේදයේ 72-73 ගාථාවල ඇතුළත්ය. ''බෝධිය නැගෙණහිරින් පණවන ලද අනර්ඝ පර්යංකරයෙහිත් භාස්වර වූ රන් මුවා බුදුපිළිමයක් හිඳු විය. ඒ පිළිරුව ශරීර අවයවයෝ සුදුසු පරිද්දෙන් නානා වර්ණ රුවනින් කරන ලද්දාහු ඉතා හෙබුහ...'' (ශ්‍රී සුමංගල හිමි, හික්කඩුවේ, දේවරක්ෂිත හිමි, බටුවන්තුඩාවේ, 1996: 122 පිටුව). යනුවෙන් මහාවංශයෙහි දුටු ගැමුණු රජු ක්‍රි. පූ. 2 වැනි සියවසේදී මහා ස්තූපයක් කරවා, එහි ධාතු ගර්භයෙහි චිත්‍ර හා මූර්තිද, බෝධි වෘක්ෂයක්ද තනා, එයට පෙරදිගින් කෝටියක් වටිනා ආසනයක රනින් කරවන ලද බුදුරුවක් තැම්පත් කළ බව සඳහන් කර ඇත. බුද්ධ ප්‍රතිමාවේ ශරීරාවයව සඳහා මාණික්‍ය එබ්බ වූ බවද එහි දැක්වේ. මහාවංශයේ සඳහන් තොරතුරු හා සමාන

විස්තරයක් වංසත්ථප්පකාසිනියේද අන්තර්ගතය. එහි දැක්වෙන පරිදි මෙම ප්‍රතිමාව හිඳි පිළිමයකි. එහි උස හිඳි ආකාරයට අඩි 24 කි., කෙස් පිඬු, රන් බිත්තියක රිදී බුබුළක් වැනි ඌර්ණාව, සමසතළිස් දන්ත පෙළද එහි ඇත. එසේ වුවද දෙතිස් මහා පුරුෂ ලක්ෂණ හෝ ව්‍යාමප්‍රභා, කේතුමාලා යනාදිය ප්‍රතිමාවේ තිබූ බවට එහි සඳහන් නොවේ. කෙසේ නමුත් මෙසේ සඳහන් වන තොරතුර සනාථ කිරීම සඳහා මෙතෙක් පුරාවිද්‍යාත්මක සාධක හෝ අභිලේඛනමය සාධක හමුව නොතිබුණද, එම තොරතුර සාවද්‍ය යැයි පැවසීමට තරම් ප්‍රබල සාධකද හමුවී නොමැත.

ක්‍රි. පූ. 2 වැනි සියවසේදී බුදු පිළිමය නිර්මාණය වන්නට ඇතැයි යන කරුණ සනාථ කෙරෙන තවද සාධකයක් සියම් දේශයේ රත්නපඤ්ඤා නම් ස්ථවිර විසින් ක්‍රි.ව. 1517දී රචිත ජිනකාලමාලී සහ රත්නබිම්බවංස නමැති ග්‍රන්ථ දෙකෙන් හමුව තිබේ. එහි සඳහන් පරිදි ක්‍රි. පූ. 2 වැනි සියවස හා සමාගාමීව ලංකාවෙන් සියම් දේශයට බුද්ධ ප්‍රතිමාවක් ලබා දී ඇත (178-182 පිටු). එම ප්‍රතිමාව වර්තමානයේදී බැංකොක්හි තක්සිං මාළිගයේ මැණික් පිළිමය බව තායිවරු විශ්වාස කරති. තිරණාගම රතනසාර හිමි පවසනුයේ එම ප්‍රතිමාව සමාධි මුද්‍රාව හා වීරාසන ඉරියව්වෙන් යුක්ත වන බැවින්ද, එබඳු ප්‍රතිමා පසුව ලංකාවෙන් හමුවී ඇති බැවින්ද මෙය ලංකාවෙන් රැගෙන ගියා යැයි දක්වා ඇති සඳහන පිළිගත හැකි මට්ටමේ පවතින බවයි.

බුද්ධ ප්‍රතිමා නිර්මාණය පිළිබඳ තවද තොරතුරක් මහාවංශයේ 35 වැනි පරිච්ඡේදයේ 89 වන ගාථාවේ දැක්වේ. එහි සඳහන් පරිදි ක්‍රි. ව. 65 - 109 කාල සීමාවේ රජකම් කළ වසභ රජු විසින් සතර බුදුවරුන්ගේ පිළිමයෙන් රම්‍ය වූ පිළිමගෙයක් රම්‍ය වූ බෝ මළුවේ කරවා තිබූ බවයි (ශ්‍රී සුමංගල හිමි, හික්කඩුවේ, දේවරක්ෂිත හිමි, බටුවන්තුඩාවේ. 1996: 149 පිටුව). එනයින් මෙම බුදු පිළිම කකුසඳ, කෝණාගම, කාශ්‍යප, ගෞතම යන සතර බුදුවරුන් සඳහා නිමවන්නට ඇතැයි සැලකිය හැකිය.

මින් අනතුරුව පළමු වන ජෙට්ඨතිස්ස රජුගේ රාජ්‍ය කාලයෙහි දේවානම්පියතිස්ස රජු විසින් ථූපාරාමයේ තැම්පත් කරනු ලැබ තිබූ බුදු පිළිමයක් ප්‍රාචීන පබ්බත විහාරයට ගෙන ගිය පුවතක්ද මහාවංශයෙහි 36 වැනි පරිච්ඡේදයෙහි සඳහන් කර ඇත (ශ්‍රී සුමංගල හිමි, දේවරක්ෂිත හිමි, බටුවන්තුඩාවේ. 1996: 157 පිටුව). එසේ වුවද, මහාවංශයෙහි දේවානම්පියතිස්ස රජු පිළිබඳ සඳහන් වන කොටසෙහි රජුගේ අනුග්‍රහය මත ඉදි කරන ලද බුද්ධ ප්‍රතිමාවක් පිළිබඳ දක්වා නොමැති බැවින් මෙම කරුණ සම්බන්ධයෙන් උගතුන් අතර මතභේදාත්මක අදහස් දැක්වීම් හට ගෙන තිබේ. දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේදී බුද්ධ ප්‍රතිමාව නිර්මාණය වූයේ නම්, එවැනි වැදගත් සිදුවීමක් රාජ්‍ය පාලකයන්ගේ ආගමික මෙහෙවර පිළිබඳ පුන පුනා විස්තර ඉදිරිපත් කරන මහාවංශ කතුවර හිමියන්හට මඟ හැරීයාම විශ්වාසයට ගත හැකි කරුණක් නොවන්නේය.

ක්‍රි. පූ. 3 වැනි සියවසත්, ක්‍රි. ව. 1 වැනි සියවසත් අතර රචනාවූ සිංහල අටුවා ග්‍රන්ථ ක්‍රි. ව. 5 වැනි සියවසේදී පමණ පාලි භාෂාවට නඟන ලදි. මහාවංශයේ ඉහතින් දක්වා ඇති බුද්ධ ප්‍රතිමා නිර්මාණය හා සම්බන්ධ තොරතුරු මෙකී අටුවා ග්‍රන්ථවල සඳහන් නොවීමද යථෝක්ත මතය පිළිගැනීම සම්බන්ධයෙන් ගැටලුකාරී තත්ත්වයක් ඇති කර තිබේ.

පාලි අටුවා ග්‍රන්ථවල සන්දර්භ 5කදී බුදු පිළිම පිළිබඳ සඳහන්වී ඇති අතර ඉන් සන්දර්භ දෙකක් පිළිබඳ තොරතුරු වල්පොළ රාහුල හිමියන් විසින් ඉදිරිපත් කරනු ලැබ ඇත. එක් අවස්ථාවක බුදුන් ප්‍රමුඛ සංඝගත දානයක් පිළිගන්වන විටෙකදී සධාතුක බුද්ධ ප්‍රතිමාවක් පූජා කළ බවට තොරතුරක් සඳහන්ව තිබේ. ඒ අනුව ප්‍රථමයෙන් සධාතුක බුද්ධ ප්‍රතිමා පමණක් පූජනීත්වයට පාත්‍රව තිබූ බවද, පසුව ධාතු රහිත බුද්ධ ප්‍රතිමාද වන්දනාවට පාත්‍ර වන්නට ඇති බවද උන්වහන්සේ විසින් ප්‍රකාශ කරනු ලැබ ඇත.

පාලි අට්ඨ කථාවල තවද අවස්ථාවකදී සධාතුක පිළිමයකට හෝ සධාතුක ස්තූපයකට බාධා පමුණුවන බෝධි වෘක්ෂයක අතු කපා ඉවත්කිරීමට අවසර ඇති බව සඳහන් කර ඇත. සාමාන්‍ය පිළිගැනීම අනුව එය මහත් වූ

පාප කර්මයකි. එසේ වුවද සධාතුක බුදු පිළිමයක් හෝ ස්තූපයක් නිසා එසේ සිදු කිරීම වරදක් නොවන බව මින් පවසා තිබේ.

දේවානම්පියතිස්ස රජ සමයට අයත් යැයි සැලකෙන පෙර සඳහන් කළ ශෛලමය බුද්ධ ප්‍රතිමාව පිළිබඳ මින් පසුව හමුවී ඇති වංශකතාවලත්, අභිලේඛනවලත් පුන පුනා සඳහන් කර තිබේ. එම මූලාශ්‍රයවල උරුසිලා පටිමා, මහසිලා පටිමා, සිලාසත්ථු, සිලා සම්බුද්ධ, සිලාමය මුනින්ද සහ සිලාමය මහේසි වැනි නාමවලින් හඳුන්වා ඇත්තේ පෙර කී ථූපාරාමය අසල ඉදි කර තිබූ බුද්ධ ප්‍රතිමාවම වන්නට ඇතැයි පුරාවිදු පර්යේෂකයෝ සඳහන් කරති. මහාවංශයට අනුව මහසෙන් රජු එම ප්‍රතිමාව ප්‍රාචීන පබ්බත විහාරයෙන් ගෙන ගොස් අභයගිරියේ තැම්පත් කොට ඇත. පසුව බුද්ධදාස, ධාතුසේන වැනි රජවරුන්ගේ පාලන කාලවලදී එය වරින් වර ප්‍රතිසංස්කරණයට ලක් කර තිබේ. හතරවන මිහිඳු රජුගේ සෙල්ලිපියේ සඳහන් ගල් පිළිමය මෙය බව පෙන්වා දෙන ඉසෙඩ් වික්‍රමසිංහ මහතා තවදුරටත් පවසනුයේ ක්‍රි. ව. 5 වැනි සියවසේ ලංකාවට පැමිණි පාහියන් භික්ෂුව දුටු බුදු පිළිමයද මෙය විය හැකි බවයි. ඒ අනුව පූර්වයේ පැවසූ පරිදි බුද්ධ ප්‍රතිමාවේ ප්‍රභවය හා විකාශය සම්බන්ධයෙන් පළ වී ඇති ප්‍රධාන මතවාද දෙක සඳහාම ඒ ඒ මතධාරීන් විවිධාකාර සාධක සපයා තිබුණද නිශ්චිත වශයෙන් නිගමනයකට එළැඹීම සඳහා එකී තොරතුරු ප්‍රමාණවත් වන්නේ නැත.

මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා පවසා ඇති පරිදි ලංකාවෙහි බුදු පිළිම කලාව ආරම්භ වන්නට පූර්වයේදී, එනම් ක්‍රි. ව. පළමු වැනි සියවසට පෙර වකවානුවේ ලාංකිකයන් බුදුන් වහන්සේ සංකේතානුසාරයෙන් වන්දනාමාන කර ඇත. භාරතයේද බුදු පිළිමය නිර්මාණය වීමට පූර්ව අවදියේ ඡත්‍රය, සිරිපතුල, වජ්‍රාසනය, බෝධි වෘක්ෂය වැනි සංකේත මගින් බුදුන් නිරූපණය කළ බව සාංචි හා භාරුත් කැනීම් මගින් සනාථ කර ගත හැකිය. මුල්කාලීන ලාංකිකයන් සංකේතාත්මකව බුද්ධ වන්දනය සිදු කිරීමට හේතු ලෙස පරණවිතාන මහතා පෙන්වා දී ඇත්තේ බුදුන් වහන්සේගේ අප්‍රමාණ වූත්, අසමසම වූත් බුද්ධ ලක්ෂණ හා බුදු ගුණ පිළිබඳ බෞද්ධයා කෙරෙහි පැවැති අසීමිත භක්තිය හා ගෞරවය නිසා මානවරූපී බුද්ධ ප්‍රතිමාව නිර්මාණය කිරීමට කලාකරුවා පසුබට වූ බවයි. ඒ අනුව ලංකාවේ ස්ථාන රාශියකින් සිරි පතුල් පාෂාණ හා ආසන ගල් රාශියක්ද, ධාතු කරඬු, ස්තූප හා බෝධි වෘක්ෂ හමුවී ඇති නිසා මේවා මුල්කාලීන ලාංකිකයා බුද්ධ සංකේත සේ සලකා වන්දනාවට පාත්‍ර කරන්නට ඇතැයි පැවසේ.

බෝධි වන්දනාවේ ඉතිහාසය බුදුන් ජීවමාන කාලය දක්වා දිව යන්නකි. වරක් තමන් වහන්සේ වැඩ සිටින බව සලකා බෝධි වෘක්ෂයට වන්දනා කළ හැකි යැයි බුදුන් වහන්සේ විසින් ආනන්ද තෙරුන්හට පවසා ඇති අතර පසුව ආනන්ද බෝධිය ඉන්දියාවේ රෝපණය කළ බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ. මෙය එරට බෞද්ධාගමිකයන් අතර බෙහෙවින් ජනප්‍රියව තිබූ අතර බෝධි වෘක්ෂය බුද්ධ සංකේතයක් ලෙස භාවිත කළ බවට සාධක රැසක් සාංචි හා භාරුත් කැටයම් මගින්ද සනාථ කර දක්වයි. බෝධිසත්ත්වයන්හට බුදුවීම උදෙසා සෙවණ ලබා දුන් බැවින්ද, බුදුන් වහන්සේ පවා එම වෘක්ෂයට අනිමිස ලෝචන පූජාවෙන් කෘතගුණ දැක්වූ බැවින්ද බෞද්ධයෝ බෝධි වෘක්ෂය උතුම් කොට සලකති. මහින්දාගමනයෙන් අනතුරුව ප්‍රාග් වන්දනා ක්‍රම අතර පැවති වෘක්ෂ වන්දනාව, බෝධි වන්දනාව බවට ආරෝපණය වී තිබේ. පසුව දුමින්දාගමනයේදී ඉන්දියාවේ ජය ශ්‍රී මහා බෝධි ශාඛාවක් මෙරටට වැඩම වීමෙන් මෙම වන්දනා ක්‍රමය ලක්දිව තුළ වඩාත් ප්‍රචලිත විය. එම බෝධි වෘක්ෂයේ අනු ශාඛා අටක් ලංකාවේ ස්ථාන අටක රෝපණය වීමද මීට හේතු වූ තවද කාරණයකි. සමන්තපාසාදිකාවේ සඳහන් වන පරිදි එම ස්ථාන අට ජම්බුකෝලපට්ටන, තවක්ක බ්‍රාහ්මණස්ස ගාමද්වං, ථූපාරාමය, ඉසුරුමුණි විහාරය, පඨමචේතියට්ඨාන, චේතියපබ්බත, කාජරගාම හා චන්දනගාම යනුවෙන් වේ. මේ හා සමාන ස්ථාන නාම අටක් මහාබෝධිවංශය, මහාවංශය, සිංහලබෝධිවංශය වැනි කෘතිවලද සඳහන්ය. මින් අනතුරුව දෙතිස්ඵලරුහ බෝධි, සූතිස් බෝධි, ආනන්ද බෝධි ආදි වශයෙන් බෝධි රෝපණ අවස්ථා ගණනාවක් පැරණි කෘතිවල සඳහන්ය.

## ස්තූප හෙවත් දාගැබ් වන්දනාව

බෝධි වන්දනාව මෙන්ම ප්‍රචලිතව තිබූ තවද බුද්ධ සංකේතයක් ලෙස ස්තූප හෙවත් දාගැබ් වන්දනාව පෙන්වා දිය හැකිය. වංශකතා අනුව මෙරට බෞද්ධ ස්තූපයක් ප්‍රථමයෙන් ඉදි කරවා ඇත්තේ බුදුරදුන් ජීවමාන කාලයේදීමය. බුදු වහන්සේ පළමු ලංකාගමනය සිදුවූ අවස්ථාවේදී උන්වහන්සේගෙන් ලබාගත් කේෂ ධාතු තැම්පත් කොට සුමන සමන් දිව්‍ය රාජයා විසින් මහියංගන ස්තූපය ඉදි කරන ලද බව මහාවංශයේ පළමු පරිච්ඡේදයේ 17-43 ගාථාවලද, පූජාවලියේද සඳහන්ව ඇත (ඤාණවිමල ස්ථවිර, 2008: 752). තවද තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයන් විසින් බුදුන් වහන්සේගේ කේෂ ධාතු තැන්පත් කොට ගිරිහඬු නම් සෑය ඉදි කරන ලද බවත් එය ලක්දිව පළමු ස්තූපය වන බවත් ජනප්‍රවාදගත තොරතුරු සඳහන්ය. එනමුදු මෙම තොරතුරු පුරාවිද්‍යාත්මක වශයෙන් නිශ්චිතව තහවුරුවී නොමැති බැවින් මෙරට පළමු ස්තූපය ලෙස සැලකෙනුයේ දේවානම්පියතිස්ස රජු විසින් ඉදිකරන්නට යෙදුණු ථූපාරාම චෛතියයි. දුටුගැමුණු රජු විසින් ඉදි කරන ලද රුවන්වැලි දාගැබ පිළිබඳ තොරතුරු රාශියක් මහාවංශය, ථූපවංශය වැනි කෘති මගින් අනාවරණය කරගත හැකිය. රජරට ශිෂ්ටාචාරයෙහි වරින්වර රජ පැමිණි රජවරුන්ගේ ශාසනික සේවාවෙහි ස්තූපයක් ඉදිකිරීම බොහෝ අවස්ථාවලදී අනිවාර්යය අංගයක් ලෙස පැවති බවට සාධක රැසක් මහාවංශයෙන් හමුවේ. එසේ ඉදි කරන ලද බොහෝ ස්තූප ගර්භවල බුදුරදුන්ගේ ශාරීරික ධාතු හෝ රහතන් වහන්සේලාගේ ශාරීරික ධාතු තැම්පත් කළ බව සාහිත්‍යික තොරතුරු මෙන්ම පුරාවිද්‍යාත්මක සාධක මගින්ද තහවුරුවී ඇත.

## ධාතු කරඬු වන්දනාව

බුද්ධ ප්‍රතිමා නිර්මාණයට පෙර පැවති බුද්ධ වන්දනා සංකේත අතර ධාතු කරඬු වන්දනාවටද ප්‍රමුඛස්ථානයක් හිමිව තිබුණි. බොහෝ අවස්ථාවලදී ධාතු කරඬු ගර්භයේ බුදුන් වහන්සේගේ ශාරීරික ධාතු හෝ රහතන් වහන්සේලාගේ ධාතු තැම්පත් කර තිබූ බව සඳහන් වේ. කෙසේ නමුත් ලංකාවෙහි ධාතු කරඬු වන්දනාව වඩාත් ප්‍රබල අයුරින් ප්‍රචලිතව පැවති බවට සාධක හමුවී නැතත් සෑම ස්තූපයකම පාහේ අභ්‍යන්තරයෙහි ධාතු කරඬු තැන්පත් කර තිබූ බවට පුරාවිද්‍යාත්මක සාධක හමුව ඇත. ධාතු කරඬුවල බාහිර ස්වරූපය ස්තූපයේ බාහිර ආකෘතිය හා බෙහෙවින් සමානව නිර්මාණය කර තිබෙන බැවින් පැරණි ස්තූපවල ආකෘතික රටා පිළිබඳව අවබෝධයක් මින් ලබාගැනීමට හැකියාව ලැබේ. කැණීම්වලදී සොයාගන්නට යෙදුණු ධාතු කරඬු අතර කොටවෙහෙර (කරඬු සිය ගණනක්), අභයගිරිය පළිඟු කරඬුව, ලාහුගල, දක්ඛිණගිරිය, මිහින්තලේ, දීඝවාපිය වැනි ස්ථානවලින් හමු වී ඇති කරඬු විශේෂ වේ. බොහෝවිට මෙම කරඬුවල ස්තූපයක ආරම්භක අවස්ථාවේ සිට කොත් කැරැල්ල දක්වා උපරිභාගය සංවර්ධනයවීමේ අවස්ථාව තෙක් වාස්තු විද්‍යාත්මක ලක්ෂණ අන්තර්ගත කොට ඇත.

## සිරි පතුල හා වජ්‍රාසන වන්දනාව

යථෝක්ත බුද්ධ සංකේතවලට වඩා ලංකාවේ බෙහෙවින් ප්‍රචලිතව තිබෙන්නට ඇතැයි සැලකෙන්නේ සිරි පතුල් හා වජ්‍රාසන වන්දනාවයි. ඊට හේතුවී ඇත්තේ අනෙකුත් බුද්ධ සංකේතවලට වඩා ප්‍රමාණාත්මකව විශාල වශයෙන් දිවයිනේ නන් දෙසින් මෙම පාෂාණ හමුව තිබීමයි. ඒ අතුරින් බුදුන්ගේ වජ්‍රාසනය නිරූපණයවන පාෂාණ රාශියක් පුරාවිද්‍යාත්මක කැණීම්වලදී සොයා ගෙන තිබේ. වජ්‍රාසන සංකේතය පිළිබඳ ඉන්දියානු සාධක විමසා බැලීමේදී බෝධි වෘක්ෂ සමීපයේ තබන ලද, බුදුන් වැඩ හිඳ බුදු බව ලැබූ වජ්‍රාසනය නිමිත්තෙන් කළ ආසනවලට ජනයා වැඳුම් පිදුම් කළ බවත්, එකී ආසන උදෙසා තැනූ සර විශේෂයක් පැවති බවටත් සාධක අමරාවතී හා සාංචි කැටයම් මගින් අනාවරණය කරගත හැකිය. මේ පිළිබඳ තොරතුරු සමන්තපාසාදිකාවේ හා මහාවංශයෙහිද සඳහන්ව ඇති අවස්ථා දක්නට ලැබේ. සමන්තපාසාදිකාවේ විනය අටුවාවේ 'චෛතියඝර, බෝධිඝර, ආසනඝර'

යනුවෙන් සඳහන්ය. තවද ආසනඝර නම් ගෘහ විශේෂයක් පිළිබඳ පපඤ්ච සුදනී නම් අටුවාවේ උපරිපණ්ණාසයේ බහුධාතුක සූත්‍ර වර්ණනාවෙහි කියැවේ. තවද අටුවාවක ''යම් ආසනඝරයක නිදන් තැන්පත් කර තිබෙන විට එය රැකීම සඳහා බෝධි ශාඛාව කැපීම වටී'' ලෙස සඳහන් වේ. මහාවංශයට අනුව ''මේඝවණ්ණඅභය රජ උතුම් වූ මහාබෝධිඝරයෙහි ශිලාමය පර්යංකය කළේය'' යනුවෙන් සඳහන්ය. මේ අනුව ආසනඝරවල ධාතු නිදන් කිරීමේ ක්‍රමවේදයක් පැවති බවත්, බොහෝ අවස්ථාවලදී ආසනඝර බෝධිය සමීපයේම ඉදි කර තිබෙන්නට ඇති බවත් අනුමාන කළ හැකිය.

තවද මෙම ආසන පාදක කොට ගනිමින් 'ආසන පූජා' නමැති පූජා විශේෂයක් තිබූ බවටද සාධක දීඝනිකායේ ආටානාටිය සූත්‍ර වර්ණනාවෙහි සඳහන්ය. තවද විසුද්ධි මාර්ග සන්නයෙහිද සිතුල්පව්වෙහිදී සිදු කළ ආසන පූජාවක් පිළිබඳ තොරතුරු සඳහන් වේ. මේ ආදි ලෙස වජ්‍රාසන වන්දනය හා සම්බන්ධිත සාහිත්‍යික තොරතුරු සනාථ කරමින් ලංකාවේ කටුවන්නාව, පුළුකුණාව, එරුපොතාන, හල්මිල්ලවැටිය, උත්තිමඩුව, වෙහෙරගල වැනි ස්ථානවලින් වජ්‍රාසන රැසක් පුරාවිද්‍යා කැණීම්වලදී සොයා ගෙන ඇත.

බුද්ධ සංකේතයක් වශයෙන් භාවිතකර ඇති සිරි පතුල් පාෂාණද ලංකාවේ විවිධ ප්‍රදේශවලින් බහුල වශයෙන් හමුවී තිබේ. ඒ අතර කන්තරෝඩය, වල්ලිපුරම්, මුලතිව්, දකුණේ යටාල වෙහෙර, තිස්සමහාරාමය, සිතුල්පව්ව, අභයගිරිය, රුවන්වැලි සෑය, අනුරාධපුරය, මිහින්තලේ, කිරින්ද ආදි ස්ථාන වේ. බොහෝ සිරි පතුල් පාෂාණ වර්තමානය වන විට අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරයේ පිටුපස එළිමහනේ මහජන ප්‍රදර්ශනය සඳහා තැන්පත් කොට තිබෙනු දැකගත හැකිය.

පොදුවේ ගත් කල්හි සිරි පතුල් පාෂාණ ස්පටික හුණුගල්, ග්‍රැනයිට්, වැනි පාෂාණ යොදා නිර්මාණය කර ඇති අතර ඒවා ආයත චතුරස්‍රාකාර හැඩයෙන් හෝ චතුරස්‍රාකාර හැඩයෙන් නිර්මාණය කරතිබීම විශේෂත්වයකි. පැතලි පුවරු ලෙස නිර්මිත මෙම සිරි පතුල් පාෂාණ ප්‍රධාන වශයෙන් අවතල යටි පතුල් ගල් හා උත්තල යටි පතුල් ගල් ලෙස කොටස් දෙකකි. අවතල යටි පතුල්හි ගල් පතුල යටට නෙරා ගිය ආකාරයක් දක්නට ලැබේ. මේ සඳහා උචිතම නිදසුන වශයෙන් අභයගිරි චෛත්‍යය මළුවේ තිබී දැනට අභයගිරියේ මහාතිස්ස ෆාහියන් කෞතුකාගාරයේ තැන්පත්කර ඇති සෙල් පුවරුවක දක්නට ලැබෙන දෙපතුල් සටහන පෙන්වාදිය හැකිය. උත්තල සිරි පතුල් ගල්වල දෙපා සටහන් උඩට නෙරා ආ ලෙස නිර්මාණය කර ඇත. මීට අමතරව සිරිපතුල් පාෂාණවල දක්නට ලැබෙන ඇඟිලි පුරුක් ද්විත්ව හෝ ත්‍රිත්ව රේඛාවලින් යුක්ත වීම, ඇඟිලි පුරුක්හි ස්වස්තික ලකුණ දක්නට ලැබීම, ප්‍රමාණයෙන් විශාල සිරි පතුල් පාෂාණවල සත්ති, ඡත්‍ර, ශ්‍රී වත්ස, භද්‍රපීඨ, සංඛ, ධජ, වල්විදුනා, අංකුස, පූර්ණපට, මීන යුගල, දෙපතුල මධ්‍යයේ ධර්මචක්‍රය යනාදිය පොදු ලක්ෂණ ලෙස පෙන්වා දිය හැකිය. එසේම කුඩා ප්‍රමාණයේ සිරි පතුල් පුවරුවල දෙපතුල් අතුරින් දෙවිළුඹ වසා ඇති යෂ්ටිය සහ ඡත්‍රය සහිත සේසත දක්නට ලැබීමද සුවිශේෂ කොට සැලකිය හැකිය.

## 3. සමාලෝචනය

ප්‍රතිමා, පටිමා, පඩිමා, පිළිම යන පදවල වාච්‍යාර්ථය වනුයේ සාංකල්පීය හෝ ස්වාභාවිකත්වය අනුකරණය ලද්දා වූ කිසියම් ආකෘතියකි. බුද්ධ ප්‍රතිමාව යනු කිසියම් ඓතිහාසික පුද්ගලයකුගේ රූපයක් නොව සංකල්පීය අනුරුවකි. ඒ අනුව බුද්ධ ප්‍රතිමාව මගින් නියෝජන කරනුයේ බුදුරජාණන් වහන්සේය. බුදුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් අනතුරුව උන්වහන්සේගේ චරිතය පදනම් කොට ගනිමින් බෞද්ධ කලා කෘති නිර්මාණ කිරීමේදී කලාකරුවා අතිශය දුෂ්කරතාවට පත් වූයේය. ඊට හේතු වූයේ පෙළ දහමට අනුව උන්වහන්සේ ප්‍රතිනිර්මාණය කළ නොහැකි සහ රූපාදියෙන් තොර අයකු වීමයි. මෙම කරුණු නිසා මෙන්ම තත්කාලීන ආගමික, දේශපාලනික, සමාජීය තත්ත්වය හේතු කොටගෙන බුද්ධ ප්‍රතිමා නිර්මාණය කිරීමේ කිසියම් පසුගාමිත්වයක් ඇතිවී තිබුණි. මේ හැරුණු කොට බුදුරදුන්ගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ, මහා කරුණාව හා

මහා ප්‍රඥාව පිළිමයකින් නිර්මාණ කිරීමේදී කලාකරුවා අපහසුතාවට පත්වීම, ධර්මය දැකීමම බුදුන් දැකීම යැයි වන සංකල්පය හා ආමිසයට වඩා ප්‍රතිපත්ති පූජාවට ප්‍රමුඛතාව ලබා දුන් ථේරවාද බෞද්ධ දර්ශනය, අසීමිත ගුණ සමුදායකින් යුක්ත බුදුන්ගේ රූපකාය යථාර්ථවාදීව නිර්මාණ කිරීම අගෞරවයක් ලෙස සැලකීම යනාදිවූ කරුණුද මෙම පසුගාමිත්වය සඳහා බලපෑ අවශේෂ කරුණු කාරණා විය.

කෙසේ නමුත් මෙබඳු පසුබිමක් යටතේ බෞද්ධ ජනයා බුදුන් වහන්සේ වෙනුවට සිරි පතුල් ගල්, බෝධිය, ස්තූපය, ධාතු කරඬු, වජ්‍රාසනය වැනි සංකේත යොදා ගනිමින් සිය වන්දනාමාන කටයුතු සිදු කළ බවට සාධක සාහිත්‍යික මූලාශ්‍රය මගින් මෙන්ම ඉන්දියාවේ සාංචි, භාරුත් කැටයම් මගින්ද, ශ්‍රී ලංකාවෙන් හමුවී ඇති යථෝක්ත පුරාවිද්‍යාත්මක සාධක මතද තහවුරු වෙයි. අනතුරුව ආරම්භවූ බුදුන් වහන්සේගේ රූපකාය ප්‍රතිමාවට නැඟීමේ කලාව සඳහා සාහිත්‍යික මූලාශ්‍රයවල නිරූපිත බුදුන් වහන්සේගේ චරිත ලක්ෂණ ඍජුව බලපා ඇති බවද ඉහත සාකච්ඡාව මගින් අවබෝධ කොටගත හැකිය.

# පරිශීලිත මූලාශ්‍රය


ඤාණවිමල නාහිමි, කිරි ඇල්ලේ (සංස්). (2008). ***මයුරපාද පරිවේණාධිපති බුද්ධ පුත්‍රයන් වහන්සේ විසින් රචිත පූජාවලිය***, කොළඹ 11: සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

ධම්මාලෝක හිමි, ජම්බුගහපිටියේ. (2012). ***ශ්‍රී ලාංකේය ප්‍රතිමාකරණ සම්ප්‍රදායය, චිත්‍ර කර්ම ශාස්ත්‍රය හා ශාරිපුත්‍ර ඇසුරෙන් ප්‍රතිමාකරණ තාක්ෂණය පිළිබඳව කෙරෙන විමසුමක්***, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

බුද්ධඝෝෂ හිමි. (2003). ***සමන්තපාසාදිකා විනයට්ඨකථා***, ධම්මකුසල හිමි, අම්බලන්ගොඩ. (පරි). කොළඹ: රාජකීය ආසියාතික සංගමය.

ශ්‍රී සුමංගල හිමි, හික්කඩුවේ, දේවරක්ෂිත හිමි, බටුවන්තුඩාවේ. (සංස්.). (1996). ***මහාවංශය සිංහල,*** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සෙනෙවිරත්න, අනුරාධ. (1981). ***සංස්කෘතිය හා කලාශිල්ප***, කොළඹ 12: ප්‍රදීප ප්‍රකාශකයෝ.

හේරත්, යමුනා. (2003). ***ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රතිමා හා රූකම්***, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.